WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

63 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

| | |
|---|---|
| ව්‍යවසායකත්ව අධ්‍යයනය | I, II |
| முயற்சியாண்மைக் கற்கை | I, II |
| Entrepreneurship Studies | I, II |

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

※ **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x) දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රත්නපුර ප්‍රදේශයේ ඉතා සුප්‍රසිද්ධ මැණික් ආභරණ නිෂ්පාදනය කර අලෙවිකරන 'ජෙම් ජුවලරි' ආයතනයට පැමිණි සුදේශ් හා ඔහුගේ විදේශ මිතුරකු වූ ඇලන්, ජෙම් ජුවලරි ආයතනයේ අධිපති වන කලණ විසින් ඉතා සුහදශීලි ලෙස පිළිගත් අතර සුළු වේලාවකින් ඔවුන් ඉතා කුලුපග මිතුරන් විය. ඔවුන් ව්‍යාපාර කටයුතු පිළිබඳ ගැඹුරු කතාබහකට යොමු වූ අතර කලණ තමා ආ ගමන් මග සුදේශ්ට සහ ඇලන්ට විස්තර කරනු ලැබුවේ මහත් ආඩම්බරයකින් ය. කලණ දැක්වූ අදහස්වලට අනුව ඔහුගේ උපන් ගම රත්නපුර වේ. පාසල් අවධියේදී ව්‍යාපාරයක් සාර්ථකව හා විධිමත් ආකාරයට පවත්වාගෙන යන ආකාරය පිළිබඳ හැදෑරූ කලණ අනාගතයේදී තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන යාම පිළිබඳ සිහින දුටුවේ ය.

(අ.පො.ස.) උසස් පෙළ ඉහළින් සමත් වූ කලණ විශ්වවිද්‍යාලයට ඇතුළු විය. එහිදී ඔහු රසායන විද්‍යාව පිළිබඳව විශේෂ උපාධියක් ලබා ගත්තේ ය. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන අතරතුර මුහුණ දුන් ආර්ථික ගැටලු අවම කර ගැනීමටත් තමා තුළ වූ ව්‍යාපාරික සිහිනය යථාර්තයක් බවට පත් කර ගැනීමටත් වටිනාකමින් අඩු මැණික් කැට පතල්කරුවන්ගෙන් මිල දී ගෙන අලෙවි කළේ ය. කෙටි කාලයක් තුළ ඔහු සුළු පරිමාණ මැණික් ව්‍යාපාරිකයකු ලෙස ජනප්‍රිය විය. කලණ තම උපාධිය අවසන් කර, පවතින ව්‍යාපාර කටයුතු තව දුරටත් පුළුල් කළේ මැණික් කැටවලට රත්‍රන්ද එකතු කර වටිනාකම වැඩි කර, නවීන විලාසිතාවලට අනුව ස්වර්ණාභරණ නිෂ්පාදනය කරමින් ය. මෙම ව්‍යාපාරය 'ජෙම් ජුවලරි' නමින් පවත්වා ගෙන යන ලදී.

ජෙම් ජුවලරි ආයතනයේ 50% කට වැඩි සේවක පිරිස, එම ප්‍රදේශයේම අඩු ආදායම් ලබන පවුල්වලින් බඳවා ගෙන ඇත. සෑම වසරක් පාසා ම ප්‍රදේශයේ ඉතා දිළිඳු පවුලක් සඳහා නව නිවසක් සාදා දීම ද කලණගේ තවත් එක් කාර්යයක් විය. මීට අමතරව ව්‍යාපාර කටයුතු ක්‍රමවත් ආකාරයට පාලනය කළ කලණ රජයට ගෙවිය යුතු බදු මුදල් ද නිසි පරිදි ගෙවන ලදී.

(i) කලණ සාර්ථක ව්‍යවසායකයකු බව තහවුරු කිරීම සඳහා කරුණු **දෙකක්** දක්වන්න.
(ii) කලණගේ 'ජෙම් ජුවලරි' ව්‍යාපාරයේ ලියාපදිංචියට අදාළ නීතිමය තත්ත්වය පැහැදිලි කරන්න.
(iii) කලණ විසින් ඉටු කරනු ලබන සමාජයීය වගකීම් **දෙකක්** දක්වන්න.
(iv) සමාජයීය වගකීම් ඉටු කිරීමෙන් කලණගේ ව්‍යාපාරයට ලැබෙන වාසි **දෙකක්** දක්වන්න.
(v) කලණගේ ව්‍යවසායක කටයුතු තුළින් ඔහුට සහ දේශීය ආර්ථිකයට හිමි වන ප්‍රතිලාභ **දෙක** බැගින් දක්වන්න.

ඉහත සිද්ධියට අදාළ කලණගේ ව්‍යාපාරයේ ඉදිරි මාසය සඳහා වූ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

WWW.OLEVELAPI.COM

| **අයිතමය** | **වටිනාකම (රු.)** |
|---|---|
| විකුණුම් ආදායම | 5 000 000 |
| අමුද්‍රව්‍ය පිරිවැය | 2 000 000 |
| ශ්‍රම පිරිවැය | 400 000 |
| වෙනත් නිෂ්පාදන පිරිවැය | 180 000 |
| පරිපාලන වියදම් | 98 000 |
| බැංකු ණය | 1 000 000 |
| විකුණුම් වියදම් | 50 000 |

ඉහත තොරතුරු ඇසුරෙන් කලණගේ ව්‍යාපාරයේ,

(vi) ඉදිරි මාසය සඳහා වූ ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය සකස් කරන්න.
(vii) ඉදිරි මාසය සඳහා වූ මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කරන්න.
(viii) ඉදිරි මාසය සඳහා වූ මුළු නිෂ්පාදන නොවන පිරිවැය ගණනය කරන්න.
(ix) ඉදිරි මාසය සඳහා වූ ශුද්ධ ලාභය ගණනය කරන්න.
(x) මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යෑම් සඳහා උදාහරණය බැගින් දෙන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

[හයවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

2. (i) 'ව්‍යවසායකයින් රටකට සම්පතක් ලෙස සැලකිය හැකි ය.' කෙටියෙන් පැහැදිලි කරන්න.
   (ii) නිෂ්පාදන සාධක අතුරෙන් භූමිය සහ ප්‍රාග්ධනයෙහි ඇති ප්‍රධාන වෙනස සඳහන් කරන්න.
   (iii) ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්වය සංවර්ධනය කළ යුතු බව තහවුරු කිරීම සඳහා හේතු **හතරක්** සඳහන් කරන්න.
   (iv) සාර්ථක ව්‍යවසායකයකුවීම සඳහා අවශ්‍ය වන සන්නිවේදන කුසලතා **දෙකක්** දක්වන්න.
   (v) 'කුඩා ව්‍යාපාර රටේ සංවර්ධනයට ඍජුවම දායක වේ.' මෙම ප්‍රකාශය සනාථ කිරීමට අදාළ කරුණු **හතරක්** දක්වන්න.
(ලකුණු 02 × 5 = 10 යි)

3. (i) ප්‍රාථමික අංශයේ ව්‍යාපාර සහ ද්විතියික අංශයේ ව්‍යාපාර සඳහා උදාහරණ **දෙක** බැගින් දක්වන්න.
   (ii) ව්‍යාපාර ආචාරධර්ම තීරණය කිරීමේදී බලපෑම් ඇති කරන ප්‍රධාන පාර්ශ්ව **දෙකක්** නම් කරන්න.
   (iii) කාන්තා ව්‍යවසායකත්වය වඩා ජනප්‍රිය ව්‍යාපාර ක්ෂේත්‍ර **හතරක්** සඳහන් කරන්න.
   (iv) ශ්‍රී ලංකාව තුළ ව්‍යවසායකත්ව සංස්කෘතියක් දියුණු කිරීම සඳහා යොදා ගත හැකි මූල්‍ය නොවන දිරිගැන්වීම් සඳහා නිදසුන් **දෙකක්** ලියන්න.
   (v) විධායක සාරාංශයක් පිළියෙළ කිරීමේදී සැලකිය යුතු කරුණු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 × 5 = 10 යි)

4. (i) ව්‍යවසායකයකුට රජයේ දිරිගැන්වීම් අවශ්‍ය වීමට හේතු **දෙකක්** දක්වන්න.
   (ii) කේවල ස්වාමි ව්‍යාපාරවල සීමා **දෙකක්** සඳහන් කරන්න.
   (iii) සංස්ථාපිත සමාගම් ආරම්භ කිරීම සඳහා ව්‍යවසායකයින් වඩා උනන්දුවක් දැක්වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න.
   (iv) වරලත් ව්‍යාපාර ක්‍රියාත්මක කළ හැකි සංවිධාන වර්ග **දෙකක්** දක්වන්න.
   (v) හවුල් ගිවිසුමක ඇතුළත් විය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 × 5 = 10 යි)

5. (i) වෙළඳපොළ විශ්ලේෂණයේදී අවශ්‍ය තොරතුරු රැස්කර ගත හැකි ක්‍රම **දෙකක්** දක්වන්න.
   (ii) අලෙවි සැලැස්මක් පිළියෙල කිරීමෙන් ව්‍යවසායකයාට ලබාගත හැකි ප්‍රයෝජන **හතරක්** සඳහන් කරන්න.
   (iii) අතීත ව්‍යාපාර පරිසරය හා සසඳා බැලීමේදී නූතන ව්‍යාපාර පරිසරයේ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
   (iv) වර්තමානයේදී නව තාක්ෂණය භාවිත කර භාණ්ඩ හා සේවා ප්‍රවර්ධනය කළ හැකි ආකාර **දෙකක්** දක්වන්න.
   (v) සුනිල් පෙරේරා ඇඟළුම් කර්මාන්තශාලා හිමිකරුවෙකි. ඔහුගේ ව්‍යාපාරයේ නිෂ්පාදනය කරනු ලබන ටී ෂර්ට් සඳහා වූ නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම සඳහා යොදා ගනු ලබන පිරිවැය අයිතම **හතරක්** දක්වන්න.
(ලකුණු 02 × 5 = 10 යි)

6. (i) හොඳ ව්‍යාපාර අදහසක් තෝරාගැනීමේ ක්‍රියාවලියේ පියවර **දෙකක්** සඳහන් කරන්න.
   (ii) ව්‍යාපාර අදහස් සහ ව්‍යාපාර අවස්ථා අතර දැකිය හැකි ප්‍රධාන වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න.
   (iii) ඔබ කැමති ව්‍යාපාරයක් තෝරාගෙන එහි ශක්තියක්, දුර්වලතාවයක්, අවස්ථාවක් සහ තර්ජනයක් සඳහා නිදසුන බැගින් දක්වන්න.
   (iv) ව්‍යාපාරයක් ස්ථාපිත කිරීමේදී සලකා බැලිය යුතු සාධක **හතරක්** නම් කරන්න.
   (v) නව ව්‍යවසායකයකු වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා අනුගමනය කළ හැකි විකල්ප මාර්ග **හතරක්** දක්වන්න.
(ලකුණු 02 × 5 = 10 යි)

7. පියල් රණසිංහ මහතාගේ තීන්ත ව්‍යාපාරය වෙනුවෙන් සැකසූ ව්‍යාපාර සැලැස්මේ තොරතුරු පහත දැක්වේ.

| **වියදම් ඇස්තමේන්තුව** | රු. |
|---|---|
| කර්මාන්තශාලා භූමිය සැකසීම | 20 000 |
| ජල පහසුකම් ලබා ගැනීම | 25 000 |
| තීන්ත සාම්පල පරීක්ෂාව | 10 000 |
| වෙළඳපොළ පර්යේෂණ වියදම් | 8 500 |
| ආරම්භක දින උත්සව වියදම් | 12 000 |
| බලපත්‍ර සඳහා ප්‍රාදේශීය සභාවට ගෙවීම් | 500 |
| තීන්ත කලවම් කිරීමේ යන්ත්‍රය මිල දී ගැනීම | 100 000 |
| පරිගණක යන්ත්‍ර දෙකක් මිල දී ගැනීම | 70 000 |

WWW.OLEVELAPI.COM

තීන්ත නිෂ්පාදනය සඳහා භාවිත කිරීමට අපේක්ෂිත ගොඩනැගිල්ල පියල් මහතාට අයත් වන අතර එහි වටිනාකම රු. 4 000 000 කි. තවද ඉදිරි සති දෙකක වියදම් සඳහා රු. 50 000 ක මුදලක් අවශ්‍ය බව තක්සේරු කර ඇත.

**අවශ්‍ය වන්නේ :**

(i) පියල් මහතාගේ ව්‍යාපාරයේ මුළු ස්ථාවර වත්කම්වල වටිනාකම ගණනය කිරීම (ලකුණු 03 යි)
(ii) මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර අවශ්‍ය කරන මුළු වියදම්වල වටිනාකම ගණනය කිරීම (ලකුණු 03 යි)
(iii) මෙම ව්‍යාපාරයේ මුළු ආයෝජන මුදල ගණනය කිරීම (ලකුණු 04 යි)
(මුළු ලකුණු 10 යි)

* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....